**ශීර්ෂ 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 16 |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 14 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම,ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මූළ ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මූළ ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,277 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,915 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවෙහි ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 335 ක් හා රු.මිලියන 27 ක් හෙවත් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10.5 ක් හා සියයට 2.5 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 135 | 3,178.02 | 2,843.01 | 335.01 | 10.5 |
| 293 | 1,098.80 | 1,071.66 | 27.14 | 2.5 |
| **එකතුව** | **4,276.82** | **3,914.67** | **362.15** | **8.47** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 72.7 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. ඉන් රු.මිලියන 71.49 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1.21 ක් හෙවත් ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 1.7 ක් ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2014 වර්ෂය සඳහා 20.02.01.04 දරන ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 1,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් එකතුව රු.මිලියන 733 ක හෙවත් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 73 ක ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.04 | 1,000 | 733 | 267 | 26 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13501 | 5.50 | 3.88 | 3.00 | 3.89 | 30.00 | 15.4 |
| 29301 | 18.00 | 14.77 | 10.00 | 11.20 | 55.00 | 36.81 |

## 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.456,451 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 26.03 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 6000/0000/000/0015/0047 | 3.63 |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0148 | 22.40 |
| **එකතුව** | | **26.03** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

**3.1 විසර්ජන ගිණුම**

**3.1.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.මිලියන 2 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) වැය විෂයයන් 03 ක් සඳහා නිසි පරිදි පුරෝකථනයකින් තොරව මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කර වෙනත් වැය විෂයයන්ගෙන් එකතුව රු.මිලියන 37.47 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වි තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 10 කට අවස්ථා 46 කදී එකතුව රු.430,500 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 13 කට අදාලව ලබා දි තිබුණු එකතුව රු. 118,319 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ත් මාස 02 ත් අතර කාල පරාසයක් තුළ අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 20 දිනැති අංක 04/2014 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව පහත පරිදි කටයුතු කර නොතිබුණි.

(i) ඉහත චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගිණුම් පියවීම පිණිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකු පත්කර නොතිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කළ බලයලත් නිලධාරියා විසින් 2014 දෙසැම්බර් 31 දිනට පසුව මුදල් පොත්වල කිසිදු ගනුදෙනුවක් සටහන් කළ නොහැකි පරිදි සටහන් තබා නොතිබුණි.

**3.5 20.02.01.04 දරන ආදායම් සංකේතය - ප්‍රාදේශීය වැවිලි සමාගම්වලින් අය කරන බදු කුලී ආදායම් ගිණුම**

----------------- ---------------------------------------------------------------------------------

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 20.02.01.04 හි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 1,000 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 733 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 73 ක් වී තිබුණි. අමාත්‍යාංශය විසින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි**.**

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 362 ක ආදායම් හිඟ හිට තිබුණි. එම හිඟ හිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී කොටගල, කහවත්ත සහ අගලවත්ත යන සමාගම්වලින් ලැබිය යුතු බදු ආදායම් ඇස්තමේන්තු කර තිබුණු නමුත් එම සමාගම් සමාලෝචිත වර්ෂයේදී කිසිඳු බදු මුදලක් ගෙවා නොතිබුණි. තවද, ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 ක් අතරින් සමාගම් 8 කින් අයවිය යුතු බදු කුලී ආදායමෙන් සියයට 22 ක සිට සියයට 77 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හිඟහිටිව පැවැතුණි.

(ඉ) ඉකුත් වර්ෂ 5 ක කාලයකට අදාළ හිඟහිටි කල්බදු කුලී ආදායම එකතුව රු.362,226,312 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එයින් රු.144,911,867 ක් හෙවත් සියයට 40 ක් පමණක් අයකර ගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායම් ඇස්තමේන්තුව ඉක්මවා රු.183,295,709 ක් එකතු කර තිබුණු අතර, 2013 වර්ෂයට අදාලව පමණක් එය රු.173,348,264 ක් වි තිබුණි. ඒ අනුව එකතු කළ හැකි හිඟහිටි ආදායම් පුරෝකථනය ප්‍රායෝගික හා තාර්කික නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) 2014 දෙසැම්බර් 31 දින වන විට 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඉකුත් වර්ෂ 06 කට අදාළව එකතුව රු.439,456,846 ක හිඟ කල්බදු කුලී අයකර ගෙන නොතිබුණු අතර, ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධ කොන්දේසි බදු ගිවිසුම්වල ඇතුළත් කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------------

විෂය අංක 13501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,230,388 ක් වූ අතර, එම හිඟහිටි ණයශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් වර්ෂ 20 ක සිට වර්ෂ 30 ක් අතර කාල පරාසයක සිට පැවැත එන රු.99,212 ක් ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරීයෙකුගෙන් රු.29,190 ක් ණය ශේෂයක් හිඟහිටව පැවැතියත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය ශේෂය අයකර ගරනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඈ) වැඩ තහනම් කර හා සේවය අවසන් කර තිබුණු සේවකයන් 04 දෙනෙකුගෙන් වර්ෂ 5 ක සිට වර්ෂ 17 ක කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.382,461 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. .

(ඉ) සේවය අත් හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 1 ක හා වර්ෂ 5 ක සිට පැවැත එන එකතුව රු.203,952 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනිමට අපොහොසත් වී තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා කාලයක සිට අළුත්වැඩියා කිරීමෙන් හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කළ යුතු වාහන 06 ක් සම්බන්ධයෙන් 2010 ජුලි 14 දිනැති අංක PA/RS/V.Vehi/2009 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව 2015 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.8 අනුකූල නොවීම

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට අයත් වතු උප බදු දීමක් සිදු කර ඇති බැවින්, එම ගැටළු නිරාකරණය කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීමට අංක 09/25641/306/145 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අමාත්‍යාංශය වෙත නියෝග කර තිබුණත්, 2015 අගෝස්තු 31 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම.**

**---------------------------------------------------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය නිසි පරිදි අනුගමනය නොකර අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ කාර්යාලය නවීකරණය කිරිම සඳහා රු.424,468 ක් වැයකර තිබුණි.

(ආ) අමාත්‍යාංශ ලේකම්වරියගේ සම්බන්ධීකරණ ලේකම් වෙත 2014 ජුනි 02 දින සිට අගෝස්තු 14 දින දක්වා කාලයට අදාළව වැටුප් හා දීමනා වශයෙන් රු.203,475 ක් ගෙවා තිබුණි. එම කාලය තුළ එම නිලධාරිණිය කාර්යාලයට පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. තවද, එම නිලධාරිණියට ප්‍රවාහන හා ඉන්ධන දීමනා වශයෙන් රු.50,000 ක්ද ගෙවා තිබුණි. ඇය අමාත්‍යාංශයෙන් සංචිත වාහනයක්ද භාවිතා කළ බව එම වාහනවලට අදාළ දෛනික ධාවන සටහන්වලින් සනාථ වී තිබුණි.

**3.10 පාඩු හා හානි**

**--------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහන 11 කට සිදුවූ අනතුරුවලින් රු.7,736,238 ක අලාභහානි සිදු වි තිබුණත්, එම අලාභහානි අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ගබඩාවේ භාණ්ඩ නැතිවීම නිසා රු.232,500 ක අලාභයක් සිදු වි තිබුණි. එම අලාභහානිය හානි පිළිබඳ ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර එම අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් ගෙන් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 කළමනාකරණ දූර්වලතා**

**------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේදී වාහනයක් අපහරණය කිරීමට කටයුතු කර තිබුණු අතර, එහි වටිනාකම රු.1,400,000 ක් ලෙස තක්සේරු කර තිබුණි. ලංසු කැඳවීමේදී ලැබී තිබූ උපරිම ලංසු වටිනාකම රු.1,032,000 ක් වි තිබුණි. ඒ අනුව ඉදිරිපත් වි තිබුණු උපරිම ලංසු වටිනාකම තක්සේරු වටිනාකමට වඩා අඩු වී තිබුණු බැවින් අමාත්‍යාංශය විසින් නැවත ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. 2013 වර්ෂයේදී එම වාහනය නැවත තක්සේරු කර තිබුණු

අතර, තක්සේරු වටිනාකම රු.900,000 ක් වි තිබුණි. නැවත ලංසු කැඳවීමේදී ලැබි තිබුණු උපරිම ලංසු වටිනාකම රු.756,700 ක් වි තිබුණු අතර එම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට වාහනය පවරා තිබුණි. 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පළමු ප්‍රසම්පාදනයේදි ලංසුව පිළිගැනීමට කටයුතු කළේනම් රජයට රු.275,300 ක ආදායම් අහිමිවීම වලක්වා ගත හැකිව තිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් 28 දින අධිවේගී මාර්ගයේදී අමාත්‍යාංශය සතු වාහනයක් අනතුරට ලක් වීමෙන් රු.3,810,756 ක අලාභහානියක් සිදු වි තිබුණු බව ඇස්තමේන්තු කර තිබුණි. එම වාහනයේ අළුත්වැඩියා කටයුතු 2015 අගෝස්තු 31 දින වන විටත් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පූර්ණ වාර්තාව 2014 ඔක්තෝබර් 15 දින වන විට ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර විගණක වෙත දන්වා තිබුණි. නමුත් අභ්‍යන්තර විගණක විසින් එම වාර්තාව 2015 අගෝස්තු 31 දින වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 16 | 03 |
| (ii) තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 88 | 55 | 33 |
| (iv) ප්‍රාථමික මට්ටම | 43 | 42 | 01 |
| **එකතුව** | **153** | **115** | **38** |

## 4. ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

---

### 4.1 අයවැය විචලනය

---

මූලධන වැය විෂයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 46 ක්දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 4.2 පොදු තැන්පත් ගිණුම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. 2,319,390 ක් වූ තැන්පතු 102 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වැවිලි සමාගමක් විසින් බද්ධ රබර් පැල මිලදී ගැනීම සඳහා 2011 වර්ෂයේදී රු.300,000 ක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එම මුදල් අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 29301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,346,505 ක් වූ අතර එම ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.242,940 ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාලයක සිට පැවැත එමින් තිබුණු අතර වර්ෂ 2 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන සේවයෙන් පහ කළ

නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 92,029 ක ණය ශේෂ සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන් ගෙන් අයවිය යුතු රු.212,810 ක ණය ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වීම් ලබා ගිය වර්ෂ 2 ක සිට වර්ෂ 7 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.117,621 ක්වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

**4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකය විසින් 2014 වර්ෂය සඳහා කාර්යයන් 27 ක් සම්බන්ධව විගණන කටයුතු සිදු කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් කාර්යයන් 15 ක පමණක් විගණන කටයුතු සිදු කර තිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුවට අයත් ත්‍රී රෝද රථයක් වර්ෂයකට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු.55,816,073 ක් විය.

**4.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.217,306 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් 2015 සැප්තැම්බර් මාසය වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.7 පාඩු හා හානි**

දෙපාර්තමේන්තුවේ වාහනයක් අනතුරට ලක්වීම නිසා රු.1,069,227 ක අලාභයක් සිදු වී තිබුණු අතර රක්ෂණ සමාගමෙන් රු.1,041,982 ක් ලැබී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණු රු.27,245 ක පාඩුවක් සම්බන්ධයෙන් අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 23 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 03 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 362 | 245 | 117 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 72 | 69 | 03 |
| (v) | වෙනත් (*අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම)** | 17 | 17 | - |
| | එකතුව | 496 | 357 | 139 |

** දැනට සිටින තනතුරට පෞද්ගලික වන සේ රබර් උපදේශන සේවා දෙපාර්තමේන්තුවෙන් හා රබර් පාලන දෙපාර්තමේන්තුවෙන්* 1994 වර්ෂයේ සිට *අනුයුක්ත කර සිටින නිලධාරීන්*